


# සුදු ඇත් පොව්වෙක්

**පසුගිය දා** මෙල්බර්න් නුවර නිම්නාද නැංවුණ ''ගිම්හාන ගී'' ප්‍රසංගයේ ශිල්පි ශිල්පිනියන් සමඟ මුහුවන්නට අප වරම් ලැබුවා. මව්බිමෙන් පිට වූවාට පසුව මෙලෙස නිස්කලංකව, සුහද පිළිසඳරේ යෙදෙන්නට ඉඩකඩ ලැබුණේ ප්‍රසංගය සංවිධානය කළ ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමයේ සොයුරන්ගේ උනන්දුව නිසාමයි. වරෙක උසුළු විසුළුද වරෙක ගී රස විඳිමින්ද වරෙක ආ ගිය තොරතුරු දොඩමින්ද, වරෙක ඉතාමත්ම හැඟීම්බර වෙමින්ද ඔවුන් හා දොඩමළුවන්නට අවකාශ ලද ඒ සුන්දර පස්වරුවේ 'ගී සඳලුව' වෙනුවෙන් ද යමක් රඳවා ගන්නට අප අමතක කළේ නෑ. පෙරහුරු කටයුතු අතරේ ගෙවුණා වූ ඒ සැදෑවේ සිය පෙරහුරුව කලින්ම නිමා කළ නිරෝෂා විරාජිනිය අප හා හුදෙකලා වුනේ කලබලකාරී බවින් මිදී ඇයගේ ගීයක් පිළිබඳව සමාධිගත වන්නටය.

''අපි බන්දුල අයියා ලියපු සින්දුවක් ගැන කතා කරමු. නිරෝෂාම මුල පිරුවා. බන්දුල නානායක්කාරවසම් නම් වූ ප්‍රවීණ ගීත රචකයාව ඈ හඳුන්වන්නේ 'බන්දුල අයියා' නමින් ඔහු ඇයට ඒ තරමටම සමීපය.

''ඔව් ඇත්තටම බන්දුල අයියාට කියන්න බැරි දෙයක් මට නැති තරම්. මගේ හිතට දුකක් වේදනාවක් ආවම මම ඒ දෙවල් කියන්නේ බන්දුල අයියාට. ඒ වගේම හිතට යමක් ආවොත් කතා කරන්නෙත් එයාට අපි මොනතරම් එක විදියට හිතන අයද කියලා කිව්වොත් මට අදහසක් එනකොට අයියා ඒ වෙන කොටත් ඒ දේට යොමු වෙලා තිබුණා. අනික තමන්ගේ අදහස් හංගන්නේ නැතිව කිව්වොත්නේ රචකයාට ඒ හැඟීම් ගොනු කරලා ලියන්න පහසු වෙන්නෙ. අමරදේව, මහගමසේකර, නන්දාමාලනී, සුනිල් ආරියරත්න, වික්ටර් රත්නායක, ප්‍රේම කීර්ති ද අල්විස්, ගුණදාස කපුගේ, රත්න ශ්‍රී සුසංයෝගයේ බිහි වූ සියක් ගී නිර්මාණ මොහොතකින් සිහි ගන්වමින් නිරෝෂා මේ අසහාය පද රචකයාට සිය කෘතවේදී බව මුලින්ම පළ කළත් පද රචනයක් ලබා ගන්නා තෙක් පමණක් අගය කර ඉන් අනතුරුව රචකයින්ව අමතක කරන බොල් ශිල්පී ශිල්පීනියන්ට කදිම පාඩමකි ඒ.

''සිසිර අයියත් ඇහුවනේ ''සුදු ඇත්පොව්වෙක්'' සිංදුව ගැන අපි ඒ ගැන කතා කරමු. නිරෝෂා 'ගී සඳලුව' සටහන් පොත ගෙන ගීයේ පද පෙළ මතකයෙන් ලියන්න පටන් ගත්තා. නිතර නොගැයෙන ගීයක පද වුවද එක හුස්මට ලියන්න තරමටම ඇය පද පෙළ පිළිබඳව උනන්දුයි. ඇයගේ අත් අකුරින් ලියවුණ ඒ පද 'ගී සඳලුව' ට අගනා සිහිවටනයක් නොවේද?

''මට ඕන වෙලා තිබුණා මව් පදවිය ලැබෙන්න ඉන්න මවක් ගැන ගීතයක් කියන්න මවකට ඇතිවෙන හැඟීම් කියා ගන්න පුළුවන් නම් හොඳයි නේද කියලා හිතුණා. දරුවෙක් ලැබෙන්න ඉන්න කොටනේ ඒ හැඟීම් ඇති වෙන්නේ. විවාහ වෙලා දරුවෝ ඉන්න ගායිකාවකට දරු නැලවිලි ගීයක් දුන්න වෙලාවක එයා ඇහුවලු මම මේ තරම් වයසද මේ වගේ සින්දුවක් කියන්න කියලා. ඒත් මම මේ සින්දුව කියන කාලයේදී මම විවාහ වෙලාවත් නෑ. දරුවෙක් උපදින්න ඉන්න මවකගේ හැඟීම් අදහස් මොනවගේද කියනා හිතන්න හිතුනේ ඒ කාලයේදීමයි. ඇත්තටම ඒ හැඟීම් විඳගන්න ලැබෙන්නේ මවක් වුණ දවසටයි. ඒ අතින් තවම මම ඒ තරම් වාසනාවන්ත වෙලා නෑ.'' නිරෝෂා මොහොතකට හැඟීම් බර වූවාය.

''තමන්ට ලැබෙන්න ඉන්න දරුවා



මොනවගේද? දුවෙක්ද? පුතෙක්ද'' වාගේ දේවල් ගැන හිත හිතා හීනමවන අම්මා කෙනෙක් ගේ අදහස් ලියවා ගන්නයි මීට වැඩියම ඕන කලේ ලැබෙන දරුවා කොයි වගේ වුණත්, දුවක් වුණත් පුතෙක් වුණත් අපි එයාට ආදරයෙන් භාරගන්න ඕන කුසේ දස මාසයක් තියාගෙන හැදුවාය කියලා බුදු බව පතන්නවත්, ලේ කිරි කර දුන්නාය කියලා උදම් අනන්නවත් හිතන්නේ නෑ අම්මා කෙනෙක්. අම්මා කෙනෙක් ඕනම දරුවකුට පුදන්නේ වෙනසක් නැති එකම ආදරය. ජීවිතයේ සැබෑව තමයි  අම්මා කෙනෙකු පළඳින කිරුළ.''

''දරුවෙකු කුසය තුළ වැඩෙන බව මවකට දැන ගන්න ලැබෙන්නේ සිහින වලින්. තමන්ට දකින්න බැරි මේ දරුවා ගැන අම්මලා සිහින මවා ගත්තේ කිරි කැටියන්ගේ පින්තූර හැමතැනම ගහගෙන මාස නවයක් පුරා එයා දරුවා පිළිගන්න සූදානම් වෙන්නෙ ඇඳ කොට්ට ඇතිරිලි, දොර ජනෙල් රෙදි, දරුවාගේ ඇඳුම්, අනිත් කලමනා පිළියෙළ කරලයි. ඇය අහන්නේ දරු නැළවිලි සින්දු තොටිල්ලය නිදන කාමරයේ ප්‍රධානම අංගය. මේ දේවල් ගැන කියවෙන වෙනමම විදිහේ සින්දුවක් ලියලා දෙන්න කියලයි මම බන්දුල අයියාට කිව්වේ.'' නිරෝෂා තමන්ගේ අදහස් නිදහස් කළේ ඉතාමත් ම හැඟීම් බරය.

''ඇත්තටම මම දැනගෙන හිටියෙ නෑ, ඒ වෙනකොට බන්දුල අයියාගේ බිරිඳට දරුවෙක් ලැබෙන්න රෝහලට ඇතුළත් කරලයි ඉඳලා තියෙන්නේ. ඉතින් බන්දුල අයියාටත් මේ අත්දැකීම් හොඳින්ම ආරෝපණය කරගන්න පුළුවන් වුණාලු. ඉතින් මේ ලියවුණ සින්දුව දොස්තර හේමන්ත පෙරේරාට පෙන්නලා ඇහුවලු ''මම නිරෝෂාට මේ සින්දුව ලිව්වා, හොඳයිද? කියලා. දොස්තර හේමන්ත පෙරේරා වාට්ටුවේ තමයි ඒ අක්කා බබා ලැබෙන්න ඇතුල් වෙලා ඉඳලා තියෙන්නෙ. දොස්තර හේමන්ත අපේ හොඳ රසිකයෙක් වගේම හිතවතෙක්.''
''ඉතින් බබාව ලැබුණ දවසේ රෝහලේ ඉඳන් ම කතා කරලා ඒ ආරංචියත් එක්කම මේ පද ටිකත් ටෙලිෆෝන් එකෙන් ම කිව්වා. ඒත් එක්කම රෝහණ අයියාට කතා කරලා මෙලඩි එක කරන්න භාර දුන්නා. ඇත්තට ම මම කියන්න ඕන නෑනේ අයියේ රෝහණ අයියා ගැන. එයා වචන ටිකට ඉහළම සාධාරණය ඉෂ්ඨ කළා. නිරෝෂා මේ 'රෝහණ අයියා'' කියලා කිව්වේ ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහ ශිල්පියාණන්ට.

''ඇත්තටම ඒ ගැන නම් අටුවා ටීකා ඕනෑ නෑ තමයි'' මද ලයෙන් ගැයෙන නැලවිලිල ගීයක ආරයට කළ නිර්මාණාත්මක තනු හා සංගීත රසය පෙරහුරුවේ දී කාලයකට පසුව යළි නැංවුණ නිසාවෙන්මයි. ඒ වෙලේත් නිරෝෂාගෙන් අප ඒ පිළිබඳව විමසිලිමත් වූයේ ''ගිම්හාන ගී'' ප්‍රසංගයේදී නිරෝෂා මෙම ගීය දෙවැනි තැනහි ලුයේ එම නිර්මාපකයින් දෙපල අතින්ම පිළිපන් ''සිනාතොටක් වී'' ගීයට පමණයි.

'' එක මවක් ඒ බබාව පිළිසිඳගත් දා ඉඳලා ඉපදෙනකල්ම මේ සින්දුව විතරක්මලු හැමදා ම ඇහුවේ. කවුරුත් කැමතියි ඔබ කාලයට හොඳ හැඟීමෙන් හිතේ සතුටින් ඉන්න. හොඳම සින්දුව හැටියට එයාගේ යටි හිතට කතා කරපු සින්දුවලු මේ. මේ සින්දුව අහපු තාත්තලා තමයි වැඩියෙන්ම කතා කළේ. කියා ගන්න බැරිව හිතේ විඳවන දේ මේ අන්දමින් වෙනකෙකුගේ වචනයෙන් හා හඬින් හෝ අසන්නට, විඳින්නට ලැබේ නම් රට බැඳීම නොවැලැක්විය හැක්කක්. පියෙකුගේ දාරක ස්නේහය මවකගේ සෙනෙහස අබියස දෙවෙනි කරන්නට ස්වභාව ධර්මයාම ගත් සාධාරණ තීරණය සැබැවින්ම පියෙකුට දැරිය හැකිද?

''සිසිර අයියා ඔය තරම් සංවේදී බව මං දැනගෙන හිටියේ නෑනේ'' කෙවෙනි අග කඳුලත් ඉපදෙනු දුටු නිරෝෂා කොඳුලාය. ජීවිතයේ සමහර බලාපොරොත්තු වෙන දේ නොලැබෙන කොට ඒ දේට අපි ආදරය කරනවා වැඩියි. ඒ තුළින් විඳින වේදනාවේ වටිනාකමත් වැඩියි. ඒ නොලැබෙන දෝ ලබා ගන්න හිතේ ඇති කර ගන්න බලාපොරොත්තුවයි අපිව ජීවත් කරවන්නේ. ඒ බලාපොරොත්තුව, හැඟීම් තමයි හොඳ නිර්මාණයකට දායක වෙන්නේ. ඒ වගේ දෙයක් සංවේදීතාවයත් වැඩි හින්දයි එහෙම වෙන්නේ. හැඟීමෙන් තොරව ගායනා කරනවාට වඩා ඒ දුක, හැඟීම තව කෙනෙකුට සන්නිවේදනය කරන්න පුලුවන් වුණා නම් තමයි අපි දිනුවා වෙන්නේ. ගීත ගොඩක් ඕන නෑ වටිනා එකක් දෙකක් කළාම ඇති. ප්‍රසංග වේදිකාවල ඉල්ලුවෙ නැති වුණාට අහලා රසවිඳවන්න පුලුවන් සින්දුවලට මම වගේම රසිකයොත් ආදරෙයි. ඉතාම ජනප්‍රිය නොවුණත් වටිනාකමක් තියෙන සින්දුවක් ගැන මැරුණත් කතා කරන්න පුලුවනි. 'ඔයා මේ තරමට හැඟීම්බරයි කියලා මම හිතුවෙත් නෑනෙ'' ඒ විහිළුවට නිරෝෂා හඬ නගා සිනාසුනාය.

ලයනල් රන්වලයන්ගේ තනුවකට අනුව අප අතින් පදයෙහි නවක ගායිකා වසන්තා මධුරාංගනී ගැයූ 'සඳ සාවී' ගීය සිය මධුර හඬින් නිරෝෂා ගැයුවේ මව්බිමෙන් වෙන්ව නිර්මාණකරනයේ සැබෑ වින්දනය නොලැබ නොරටක වෙසෙන අපගේ සිත සුව පිණිස වන්නට ඇත.
'' ඒ ළමයා හරි දක්ෂයි. හොඳට කියලා තියෙනවා'' නිරෝෂාගේ හෝරාවකට වැඩි වූ පිළිසඳර නිමා කළාය. අන් අයගේ දේ ද අගැයීම නියම කලාකරුවකු සතු විය යුතු අගනා ගුණාංගයක් නොවේද? අපව සංවිධායක මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කළ ප්‍රසන්න කුරුකුලරත්න සොයුරාටද මෙහිදී අපගේ කෘතවේදී විය යුතුමය ■

සුදු ඇත් පොව්වෙක්
සුදු පියුම සොඬින් ගෙන
පැදකුණු නොකළත් සිරි යහනේ
පෙරුම් පුරා මා කුසට පැමිණි බිළිඳු
මට රජ පැටියෙක්.....ෟ

හංකිති කවමින් කුස තුළ සක්මන් කරනා
නුඹ දඟයකු වේදැයි
නිකමට මෙන් මට සිතෙනා
පැටියෝ
නුඹ දුවක වුණත් මට පුතෙකු වුණත්
මා නුඹට පුදන්නේ
වෙනසක් නැති එක ආදරයයි ..... ෟ

කුල තුල දැරුවැයි මතු බුදුවන පැතුමන් නෑ
ලෙය කිරි කර පෙව්වැයි
උදම් අනන්නට රිසි නෑ පැටියෝ
නුඹ දුවක වුණත් මට පුතෙකු වුණත්
මා හිස පළඳන්නේ
සැබෑව දිදුලන ජීවිතයයි......ෟ

**පද බන්දුල නානායක්කාරවසම්**
**සංගීතය රෝහණ වීරසිංහ**




නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ